රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 12/94

මගේ අංකය :- III/0266/2/68/එල්/ඒ/VII(I)
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1994.02.23 දින.

සියළුම ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

**1993 දෙසැම්බර් මස ඇතිවූ ජල ගැල්මෙන් හානි පැමිණි**
**රජයේ නිලධාරීන්ට විශේෂ අත්තිකාරම් මුදලක් ගෙවීම.**

1993 දෙසැම්බර් මස අග භාගයේදී ඇද හැලුණු ධාරානිපාත වර්ෂාව හා ජල ගැල්ම හේතුවෙන් විපතට පත් වූ/දේපල විනාශ වූ උතුරු, උතුරු මැද, වයඹ හා නැගෙනහිර පළාත්වල රජයේ නිලධාරීන්ට රු.1000/- ක පොළී රහිත විශේෂ අත්තිකාරම් මුදලක් ගෙවීමට රජය තීරණය කර ඇත.

02. ජල ගැල්මේ හේතුවෙන් ඇත්ත වශයෙන්ම නිලධාරීන් විපතට පත්වූ/දේපල විනාශ වූ බවට ගෙවීම් බලධාරීන් සෑහීමට පත්වීමෙන් පසුව පමණක් ගෙවීම් කළ යුතුය.

03. මෙම අත්තිකාරම් මුදල සමාන වාරික දහයකින් ආපසු අය කර ගත යුතු අතර, “රජයේ නිලධාරීන්ට අත්තිකාරම් “ බී“ ගිණුමට හර කළ යුතුය.

04. මෙම අත්තිකාරම් මුදල සම්බන්ධයෙන් අඩු කර ගැනීම් ආයතන සංග්‍රහයෙහි XXIV පරිච්ජේදයෙහි 3 වගන්තියේ සඳහන් වන 40% හා 33 1/3% සීමාවන්ගෙන් නිදහස්ය.

05. අනියම් හා තාවකාලික සේවකයින් සඳහා මෙම අත්තිකාරම් මුදල ගෙවන්නේ නම් ඇපකරු වශයෙන් ස්ථිර සේවකයෙක් ඇප විය යුතුය.

06. මෙම චක්‍රලේකය නිකුත් කරනු ලබන්නේ භාණ්ඩාගාරයේ එකගත්වය ඇතිව බව ද කරුණාවෙන් සලකන්න.

අ.කලේ/(වයි.බී.පුස්සෙදෙනිය)
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.